**ඉතිහාසය - 12 ශ්‍රේණිය**

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය - 04 වන පාඩම**

**දයාබර දූවේ පුතේ,**

ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳව ඔබ අවබෝධයෙන් සිටින බව අපගේ විශ්වාසයයි. එබැවින් ඔබගේ විෂය නිර්දේශයේ එන 04 වන පාඩම වූ ජනාවාසවල ආරම්භය හා ව්‍යාප්තිය පාඩමට අදාළ සටහන් නැවත කියවා පහත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලිවීමට උත්සාහ කරන්න. ඔබට ජය නියතයි.

01)

I. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය හා ජනාවාස පිහිටුවීමට අදාළ ප්‍රධාන අවධීන් 2 ක නම් කරන්න (ල.01)
II. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ ලෙන් 4ක් නම් කරන්න (ල.02)
III. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ අභිචාර විධි (සිරිත් විරිත්) පැහැදිලි කරන්න (ල.03)
IV. ප්‍රාග් ඓතිහාසික මානවයා සිය ජීවන රටාව ගෙනගියේ කෙසේ දැයි පැහැදිලි කරන්න (ල.08) (ජීවන රටාව යනු ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ආහාර රටාව, ජනාවාස පිහිටුවීම, අභිචාර විධි, තාක්ෂණය ආදී සියලුම කරුණුය)

02) පහත මාතෘකා ඇසුරෙන් පූර්ව ඓතිහාසික යුගය විස්තර කරන්න (ල.16)

I. ජනාවාස
II. තාක්ෂණය
III. ජීවන රටාව

**ඉතිහාසය - 12 ශ්‍රේණිය**

**ඉන්දියා ඉතිහාසය - 03 වන පාඩම**

**දයාබර දූවේ පුතේ,**

ඉන්දීය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳව ඔබ අවබෝධයෙන් සිටින බව අපගේ විශ්වාසයයි. එබැවින් ඔබගේ විෂය නිර්දේශයේ එන 03 වන පාඩම වූ ඉන්දු නදිය කේන්ද්‍ර කොට බිහි වූ හරප්පා නාගරික ශිෂ්ටාචාරය පාඩමට අදාළ සටහන් නැවත කියවා පහත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලිවීමට උත්සාහ කරන්න. ඔබට ජය නියතයි.

01) හරප්පා ශිෂ්ටාචාරය පුරාතන ලෝකයේ ඉතා දියුණුම සභ්‍යත්වවලින් එකකි.

I. ඉන්දු නිම්න සභ්‍යත්වය පිළිබඳ කැණීම්වලට සම්බන්ධ වූ පුරාවිද්‍යාඥයින් දෙදෙනෙකු නම් කරන්න (ල.02)

II. ඉන්දු නිම්න වැසියන්ගේ ආගමික විශ්වාස දෙකක් දක්වන්න (ල.02)

III. මෙම සභ්‍යත්වයේ වැදගත් මධ්‍යස්ථාන තුනක් නම් කරන්න (ල.03)

IV. හරප්පා ශිෂ්ටාචාරය ලෝකයේ ඉතා දියුණු සභ්‍යත්වයක් ලෙස කොතෙක් දුරට සැලකිය හැකිද ? (ල.07)

02) ඉන්දු නිම්න සභ්‍යත්වයේ සමාජ ආර්ථික හා සංස්කෘතික කටයුතු පරික්ෂා කරන්න (ල.16)

03) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ආරම්භය හා බිඳ වැටීම පිළිබඳව ඇති විවිධ මත පරික්ෂා කරන්න (ල.16)